**අප අතරින් වියෝ වූ ප්‍රවීණ ලේඛක ඩීබී කුරුප්පු මහතා පුවත්පතකට ලියූ අවසන් ලිපිය ළබන කළාපයේ බලාපොරොත්තුවන්න**




අපේ ආච්චි කියපු කතාවක් මට මතක්වන්න් වර්තමාන ශ්‍රී ලංකා රජය කියන කරන දේ ගැන බලන විට ය. අකුරක් නොදත් උන්දෑ කටට ආවාට කිසිවක් කියන මෝඩියක් නොවූවා ය. අසූ අට වසරක් මෙළොව ගතකොට ලබා ගත් අත්දැකීම් හා පැහිච්ච

මිහිපිට නැත.

දහම් දිවයිනට පළමුකොට ලැබුණු භාග්‍යය හෙවත් සම්පත වූ කලී පරාද වෙච්ච රජයේ හිටපු දක්ෂතම ඇමතිවරුන් උසස් තැන් වලට පත් කිරීමට හැකි වීම ය. පොඩි

කොන්ත්‍රාත්තුකාර සමාගමට දෙනු ලබන සියයට දහයේ වට්ටම වැටෙන්නේ විෂය භාර ඇමතිතුමාගේ සාක්කුවට බව ඔහුට වැටහුණේ එවිටය.

තවත් නිදසුනක් ඔහු මට කීවත් ඒවා අවශ්‍ය

# ජේන බලන යහපාලකයෝ




බුද්ධියකුත් ඇය සතු විය. අන්න ඒ දැනුවත්කම උඩය ඇය කියන දෙයක් කීමට පුරුදුව සිටියේ.

ආච්චිගේ කියමන් ඇය අපට පෙන්වා දෙන උපහැරණ ගැන අපේ මාමා කියපු වචනයක් මට මතක් වෙයි.

මුන්දැගෙ කටේ මසුරන් දාන්න වටිනවා

අන්න ඒ වර්ගයේ කියමනක් තමයි අපට නිතර දෙවේලේ කියා දුන්නේ.

කොල්ලෝ හොරාගෙ අම්මගෙන් ජේන අහන්න එපා බොල...

උන්දැගේ බොල කියන වචනය ආදරෙන් පිරිච්ච එකක්. බොහොම ළෙංගතුව කියපු වචනයක්. අපිට ඒ උපදෙස් දේව වාක්‍යයකට වඩා උතුම්.

ශ්‍රී ලංකාව වනාහි කවර දේකට වුවත් ලස්සන නම් දමා රට වැසියා ඉදිරියේ තැබීමට සමත් රජයක් ලබාගත් වාසනාවන්ත දිවයිනකි. මතට තිත * රට පෙරට * දරිද්‍රතාව තුරන් කිරීම * ගැමි පුබුදුව * ග්‍රාමෝදය * සූර්යතාප මංගල්‍යය * ආදී මෙකී නොකී නම් වලින් ජනතාව පුබුදු කරමින් ජනතා උද්‍යොගය නංවා ලමින් අනාගත සෞභාගයය කරා සමස්ථ ජනතාව මෙහෙයවන රජයක් ලැබීමට පින් කළ දහම් දිවයිනකි. හරියටම කියතොත් දහම් දිවයින ය. වෙන ඒ නම ලැබීමට සුදුසු දිවයිනක්

පරහකට ඇත්තේ ඔය කියන දක්ෂතාව ඒ හැම දෙනාටම තිබුණේ ගසාකෑම සහ පගා ගැසීම අතින් වීම ය. එකම නිදසුනක් දක්වමි. මේ කියන ඇමතිතුමා එවක සිටියේ සෞඛ්‍ය අමාත්‍ය පදවිය උසුලමින් ය. ඒ 2005 ජනපති හැටියට මහින්ද රාජපක්ෂ ප්‍රථම වතාවට ඉදිරිපත් වූ කාලයයි. මාසය නොවැම්බර් හැටියට ය මට මතක තිබෙන්නේ. මා නැවතී සිටියේ මගේ මිත්‍රයකු වූ ඉංජිනේරුවකු ගේ නිවසේ ය. ඔහු කොන්ත්‍රාත්ත*වක් මත සෞඛ්‍ය අමාත්‍යංශයේ කිසියම් තනතුරක් දරමින් සිටියේ ය. තනතුර මම නොදනිමි. මට මතක හිටියේ ඔහු කියූ කතාව පමණි.

ඇමතිතුමා තකහනියක් ඔහු ළගට ආවේ ගණකාධිකාරිගෙන් කරගතයුතු වැඩක් ගැන කියන්නට ය.

අයිසේ අර සමාගමට දිය යුතු චෙක්පත ඉක්මණට මට දෙන්න

ඇමති නියෝගය යථා පරිදි අදාල නිලධාරියාට දැන්වීම මගේ මිතුරාගේ රාජකාරිය විය. එහෙත් මේ අමුතු විදියේ ඉල්ලීම පිළිබඳ කුකුසක් ඔහුට හටගත්තේ ය. ඔහු බලා සිටියේ ඒ සමාගමේ නියෝජිතයා නැවත එන තෙක් ය. ඔහු පැමිණියේ ය. මගේ මිතුරාගෙන් ප්‍රශ්නයක්.

ඇමතිතුමා අර චෙක් පත ඉක්මන් කරන්න කියලා ඉල්ලා ගත්තේ මොකද?
ඒක ඇමතිතුමාට දෙන කොමිස් එකනේ

නැත. ඇමති හදිස්සියට හේතුව මටම හිතා ගත හැකි විය. ඒ ජනපතිවරණය ඔන්න මෙන්න කියා තිබුණ අවදියයි. බැරි වෙලාවත් මහින්ද රාජපක්ෂ පැරදුණා නම් ඔහුගේ කටේ පස් ය. ඒ ඇමතිතුමාත් හස්තිරාජයා වගේ ය.

උන්නත් දාහයි - මළත් දාහයි කියා අපේ ආච්චි කීවේ ඇතා ගැන ය.

මළ ඇතාගේ දළ දෙක විකුණා දාහ ගැනීම සුලු කරුණකි. පැරදුණු මහින්ද ළග හිටපු පරණ ඇමතිඨ දැන් ඊටත් වඩා සරුපල සහිත ඇමති පදවියක් හිමි වී ඇත.

අවුරුදු දෙකහමාරක්ම කටින් බතල හිටවූ රජයට එකම දූෂිතයකු මෙතෙක් සිරගෙට යැවීමට හෝ දණ්ඩණයකට යටත් කිරීමට හැකි වී නැත. වීරවංස වැනි කටකාරයන් හන්දියක් ගානේ දේසනා කරන්නේ ඒ නිසා ය.

දූෂණ විමර්ශනය ස_හා පත් කරන ලද කමිටු

**කලින් රජයේ ඉඩම් පිළිබ_ බලතල සහිත ඇමති ධුරයක් දැරූ ඔහුගේ චිට් කතාව මට කීවේ මගේ ගෝලයෙකි. අක්කර 100 - 200 ආදී ප්‍රමාණයේ ඉඩම් බද්දට ගෙන වටිනා ව්‍යාපාර දියත් කිරීමට කැමති අය ඔහු ඉදිරියේ පෙනී සිටිය යුතු විය. ඇමතිතුමා අපේ ක්ෂකයාට සවන් දෙන අතර කඩදාසි කැබැල්ලක කුරුටු ගාන්නේ ය.**

හා මණ්ඩල අනන්තය. අදත් දූෂණයට එරෙහිව කයිවාරු ගහන එක් ඇමතිවරයෙක් රජයේ බලගතු පුද්ගලයෙක් බවට පත්ව සිටියි. කලින් රජයේ ඉඩම් පිළිබ_ බලතල සහිත ඇමති ධුරයක් දැරූ ඔහුගේ චිට් කතාව මට කීවේ මගේ ගෝලයෙකි. අක්කර 100 - 200 ආදී ප්‍රමාණයේ ඉඩම් බද්දට ගෙන වටිනා ව්‍යාපාර දියත් කිරීමට කැමති අය ඔහු ඉදිරියේ පෙනී සිටිය යුතු විය. ඇමතිතුමා අපේ ක්ෂකයාට සවන් දෙන අතර කඩදාසි කැබැල්ලක කුරුටු ගාන්නේ ය. එය හෙම්හිට අර පුද්ගලයා අතට ලැබෙන්නට සළස්වනු ලැබේ. එහි සඳහන්වන්නේ ඉලක්කම් කීපයකි. ඉංගිරිසි වදනක්ද පසුපස ඇතිව ය. එය සිංහලෙන් මෙහෙ දැක්විය හැකිය.

05 මිලියන්

කජුඇට කොස් ඇට නොවේ. ශ්‍රී ලංකාවේ වළංගු මුදලින් ලක්ෂ පනහකි. නැතහොත් කෝටි පනහකි.

**ගරු සිරිසේන මැතිතුමනි, මෙහෙම යොරුන් වට කරගෙනද ඔබ තුමා දුප්පත්කම 2017 දී තුරන් කිරීමට යන්නේ?**

